# දහම් ගුරු ප්‍රථම විභාගය - 2020

## I පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

---

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

i. ශුද්ධ වූ දේශයට ඒ නම යෙදී ඇත්තේ ඇයි?

- ක්‍රිස්තුන් වහන්සේගේ උපත, දූත සේවාව, දුක් විඳීම, මරණය හා උත්ථානය මෙම ප්‍රදේශයේ සිදු වූ නිසා

ii. ගලීල මුහුද හා අවට ප්‍රදේශයට ක්‍රිස්තුන් වහන්සේ හා බැඳී පවතින බවට උදාහරණ **දෙකක්** දෙන්න.

- පළමු ශ්‍රාවකයන් හතරදෙනා කැඳවීම. (මතෙව් 4:18)
- ලාදුරු රොගියාට සුවය.
- මාරුත දමනය
- ශ්‍රාවකයන් දොළොස්දෙනා පත් කිරීම.

  මේ සැමදෙයක් ම සිදුවූයේ ගලීල මුහුද අවට ය.

iii. සති මංගල්‍යය යනුවෙන් නම් කරන මංගල්‍යය කුමක් ද?

- පෙන්තකෝස්ත මංගල්‍යය

iv. දේව මාලිගාව කැප කිරීමේ මංගල්‍යය පසු කලක දී කිනම් නාමයකින් හැඳින්වී ද? .

- ආලෝකයේ මංගල්‍යය

v. දිවැසිවරුන්ගේ ප්‍රධානතම කාර්යය කුමක් ද?

- දෙවියන් වහන්සේගේ වචනය කාලයට, දේශයට ඔබින ලෙස ජනතාවට ප්‍රකාශ කිරීම.

  දේව වචනයේ සාක්ෂිකරුවන් වීම.

vi. බැබිලෝනිය විප්‍රවාසය පිළිබඳ ලියා ඇති උපමා **දෙකක්** නම් කරන්න.

- වියළි ඇටකටු සහිත මිටියාවත
- ලී දෙක සම්බන්ධ උපමාව
- සමිඳාණෝ යහපත් එඬේරාණෝ ය.

vii. නව ගිවිසුමට අයත් පොත් කාණ්ඩ **දෙකක්** නම් කරන්න.

- ඉතිහාස පොත්
- ලිපි
- දිවැසි ග්‍රන්ථ (අනාවරණ සාහිත්‍යය)

viii. ශුද්ධ වූ පාවුලු තුමා කොරින්ති ලිපි ලියන ලද්දේ ඇයි?

- කොරින්ති සංඝයේ තරුණයන් හා වැඩිහිටියන් අතර ඇති වූ ප්‍රශ්න නිරාකරණය කිරීමට.

ix. නව ගිවිසුම පුරාණ ගිවිසුම තුළ සැඟ වී ඇත. නව ගිවිසුම පුරාණ ගිවිසුම එළිදරව් කරයි. මෙසේ ප්‍රකාශ කර ඇත්තේ කවුද?

- ශුද්ධ වූ අගොස්තීනු මුනිතුමා

x. ජේසුස් වහන්සේ පරිහරණය කළ ශුද්ධ වූ බයිබලය වූයේ කුමක් ද?

- පැරණි ගිවිසුම අඩංගු හෙබ්‍රෙව් බයිබලය

xi. අද දිව්‍ය පූජා යාගයේ දී උච්චාරණය කරන විශ්වාස ලක්ෂණය කිනම් වසරක, කිනම් මන්ත්‍රණ සභාවක් මගින් බිහි වූවක් ද?

- ක්‍රි.ව. 325 දී නිසියානු මන්ත්‍රණ සභාවේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ නිසියානු විශ්වාස ලක්ෂණය

xii. ශුද්ධ වූ සෙනසුරාදා මෙහෙයෙහි කොටස් **දෙකක්** නම් කරන්න.

- ආලෝකයෙහි මෙහෙය
- ප්‍රසාද ස්නාපනය මෙහෙය
- දිව්‍ය පූජා මෙහෙය
- දේව වාක්‍යයය මෙහෙය

xiii. දේවානුභාවය කැටිකර දක්වන වර්ග **දෙකක්** දෙන්න.

- එඬේරික දෙවානුභාවය
- වාචික දේවානුභාවය
- ලේඛක දේවානුභාවය

xiv. ද්විතීය සම්මත ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

- උපදේශකයා හෙවත් සිරාක්
- සලමොන්ගේ ප්‍රඥාව
- තෝබිත්
- ජූඩිත්
- බාරුක්
- මකබී I, II

xv. ශුද්ධ වූ බයිබලයට අනුව ජනතාව පුරාණයේ සිට ම දෙවියන් වහන්සේට පුද පූජා පැවැත්වීමට හේතු වූ කරුණු **දෙකක්** ලියන්න.

- දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට
- දෙවියන් වහන්සේට වන්දනා කිරීමට
- පව්වලට සමාව ලබා ගැනීමට
- අවශ්‍යතා සපුරා ගැනීමට
- රැකවරණය ලබාගැනීමට

xvi. දිව්‍ය පූජා යාගයේ එන තුන් ප්‍රකාර සාධුකාරයන්ගෙන් **දෙකක්** ලියන්න.

- සුවිශුද්ධ ගායනා කිරීම.
- ගාම්භිර එහෙයියාව (මහා ආමේන්)
- විශ්වාසයේ අභිරහස ප්‍රකාශ කිරීම.

xvii. ආගමන කාලයේ ශ්‍රී වචනය තුළින් අපට මුණ ගැහෙන චරිත **දෙකක්** නම් කරන්න.

- ආබ්‍රහම්
- දාවිත්
- යෙසායා
- ස්නාවක ජොහන් තුමා
- මරිය තුමිය

xviii. මුල් කිතුනු සභාවේ විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

- ඉගැන්වීම.
- සහභාගිකම
- රොටී කැඩීම.
- යාච්ඤා කිරීම.
- සියලු දේ පොදුවේ බෙදා ගැනීම.

xix. මාංශගත වීමේ අභිරහස සිහිකරන යැදුම කුමක් ද?

- තුන්කාල ආරාධනාව.

xx. අප යාච්ඤා කළ යුතු අවස්ථා **දෙකක්** ලියන්න.

- අළුයම අවදි වූ විට
- නින්දට යාමට පෙර හා පසු
- කෑමට පෙර හා පසු
- දුර්පරීක්ෂාවල දි
- ප්‍රධාන වැඩ ආරම්භ කිරීමට පෙර
- හදිසි අවස්ථාවල දි
- ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක දීම.

2. i ඉශ්‍රායෙල් ජනතාව ජෙරුසලමේ පැවත් වූ ප්‍රධාන මංගල්‍ය හා ආගමික උත්සව අතරින් **පහක්** නම් කරන්න.

- නුමුහුන් රොටී අනුභව කරන පාස්කු මංගල්‍යය
- නාඹුල් ඵල හෙවත් පෙන්තකොස්ත මංගල්‍යය
- කුඩාරම් මංගල්‍යය හෙවත් අස්වැන්න මංගල්‍යය
- කැපකිරීමේ මංගල්‍යය
  - සබත් දවස
  - පශ්චත්තාප දවස
  - පස ඇට මංගල්‍යය
  - පැරණි එඬේරුන්ගේ මංගල්‍යය
  - කානාහි පැවැත්වුණු අස්වැන්න මංගල්‍යය

ii 'ශුද්ධවූ දේශයේ ජන ජීවිතය'' පිළිබඳ කරුණු **පහකින්** පැහැදිලා කරන්න.

- සාමාන්‍ය ජනතාවගේ බදු අය කරන රදළ පන්තිය සැපවත් ජීවිත ගත කිරීම.
- ජෙරුසලෙම ආශ්‍රිත ව විසූ පූජක පෙළපත පොදු ජනතාව තලා පෙළා උසස් ජීවිත ක්‍රමයක් පවත්වාගෙන යාම.
- පූජක පෙළපත තම වාසිය උදෙසා ම නීති හා සම්ප්‍රදායයන් සකසා ගැනීම.
- පොදු ජනතාවගේ ආර්ථිකය එඬේරික හා කෘෂිකාර්මික රටාවක් මත පැවතීම.
- ගලීලයේ බොහෝ දෙනෙක් ධීවරයන් වීම.
- ගලීල වැසියන් දූර්වල බුද්ධිහීන අය ලෙස පිටස්තර ලෝකයා සැලකීම.
- දරුණු අදහස් ඇති සමරිතානුවෝ තම ප්‍රදේශය තුළ පමණක් ජීවත් වීම.
- ජුදයාවේ බොහෝ දෙනා ග්‍රීක් බස උගත් බුද්ධිමත් අය වීම.
- මානයෙන් හිස උදුම්මාගත් රදළ පිරිසක් ජෙරුසලෙම ආශ්‍රිත ව විසීම.

3 i දිවැසිවරු ජනතාවට කථා කළ ප්‍රධාන තේමා **පහක්** නම් කරන්න.

- සමාජ සාධාරණත්වය
- යුක්තිගරුක බව.
- දුක් විඳින සේවකයා
- මෙසියානු සංකල්පය
- ඒක දේවවාදය
- ස්වාමින් වහන්සේගේ දවස
- ගිවිසුම් සංකල්ප

ii පංච පුස්තකය යනු කුමක්දැයි කරුණු **පහකින්** පැහැදිළි කරන්න.

- නීති පොත් කාණ්ඩයට අයත් බයිබලයේ පළමු පොත් 5 කි.
- ඉශ්‍රායෙල් ජනතාව දේව ජනතාවක් බවට පත්වීම හෙවත් ඊජිප්තුවේ වහල්කමින් මිදී විමුක්තිය ලබා ගැනීම පොදු තේමාවයි.
- මුළු පංච පුස්තකයේ ම කැපී පෙනෙන පුද්ගලයා මෝසෙස් ය.
- පංච පුස්තකයේ කේන්ද්‍රීය සිද්ධිය සීනයි ගිවිසුමයි.

- ♦ දෙවියන් වහන්සේ හා මිනිසා පිළිබඳව මූලික සත්‍යතා උත්පත්ති පොතෙහි ද,
- – දේව ජනතාවගේ විමුක්තිය පිළිබඳ නික්මයාමෙහි ද,
- – පූජක පරපුර බිහිවීමේ ඉතිහාසය ලෙවී කථාවේ ද
- – පූජක වත්පිළිවෙත් හා ඊජිප්තුවෙන් පිටත් වූ ජනතාවගේ සංඛ්‍යාව තොරතුරු ගණන් කථාවේ ද
- - මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිබඳ ගැඹුරු ධර්මයක් ද්විතිය කථාවෙන් ද පෙන්වා දෙයි.

4. i ද්විතීය සම්මත ග්‍රන්ථ අනුමත නොකළ සභා පියවරු **පස්දෙනෙක්** නම් කරන්න.
   - ♦ ජෙරුසලමේ සිරිල් තුමා
   - ♦ ග්‍රෙගරි තුමා
   - ♦ ජෙරොම් තුමා
   - ♦ එපිපානියස් තුමා
   - ♦ ජෝන් ඩැමසින් තුමා

   ii දහම් ගුරුවරයෙකු ලෙස ඔබට ශු. බයිබලය වැදගත් වන්නේ ඇයි දැයි කරුණු **පහකින්** පැහැදිලි කරන්න.
   - ♦ දෙවියන් වහන්සෙගේ උත්තරීතර ප්‍රේමයටත්, ක්‍රිස්තුන් වහන්සේටත් සාක්ෂි දැරීම දහම් ගුරුවරයාගේ මූලික කාරයය යි
   - ♦ ශුද්ධ බයිබලය තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමයත්, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත සාක්ෂියත් අත්දැකිය හැකි බව.
   - ♦ දෙවියන් වහන්සේ සමග සම්බන්ධ වීමට ශු. බයිබලය රුකුලක් බව.
   - ♦ දෙවියන් වහන්සේ ශු. බයිබලය තුළින් අපට කතා කරන බව.
   - ♦ අප ජීවිත නිවැරදි මග ගෙන යාමට ශුද්ධවූ බයිබලය අපට මග පෙන්වන බව.
   - ♦ දහම්ගුරු පාඩම්වල අත්තිවාරම ශු. බයිබලය මත ගොඩනැගීමට ආධාරකර ගැනීම.

5. i දිව්‍ය පූජාවේ දේව වාක්‍යය කොටසට අයත් ප්‍රධාන කොටස් **පහක්** නම් කරන්න.
   - ♦ පළමුවන දේව ප්‍රකාශණය
   - ♦ පිළිතුරු ගීය
   - ♦ දෙවන දේව ප්‍රකාශණය
   - ♦ සුපුවත් ජයනද
   - ♦ සුබාරංචිය
   - ♦ දේශනය
   - ♦ විශ්වාස ලක්ෂණය
   - ♦ විශ්වාසිකයන්ගේ යැදුම්

   ii දිව්‍ය පූජා යාගයට ක්‍රියාකාරි ලෙස සහභාගි වීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග **පහක්** පැහැදිලි කරන්න.
   - ♦ දිව්‍ය පූජාවේ ආරම්භයේ සිටම අවසානය දක්වා ම භක්තියෙන් සහභාගි වීම.
   - ♦ නියමිත යැදුම් හා පිළිතුරු උච්චාරණය කිරීම.
   - ♦ නියමිත ඉරියව් නිසිලෙස භාවිතය.
   - ♦ ගීතිකාවලට සහභාගිවීම.
   - ♦ පඬුරු පිදීමට දායකවීම.
   - ♦ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගෞරවයෙන් ලබා ගැනීම.
   - ♦ දේව වචනයට සවන් දී ඒ අනුව ක්‍රියාකාරි වීමට උත්සාහ කිරීම.
   - ♦ දේශනයට සවන් දීම.

6. i චතාරික සමයේ පැවැත්වෙන ප්‍රධාන ජනවන්දනා දිනයන් **පහක්** නම් කරන්න.
   - ♦ අළු බදාදා
   - ♦ ගොබ් ඉරිදා
   - ♦ තෛලාශීර්වාද පූජා මෙහෙය
   - ♦ මහ බ්‍රහස්පතින්දා
   - ♦ මහ සිකුරාදා

ii චතාරික සමය තුළ කිතුනුවන් කළ යුතු ක්‍රියාවන් **පහක්** පැහැදිලි කරන්න.

- ♦ ක්‍රිස්තුන් වහන්සේ පාළුකරයේ ගතකළ ද යාච්ඤාවේ, මර්දනාවේ ජීවිතයට අපිදු ඒකාබද්ධ වීම.
- ♦ පසුතැවිල්ලේ, ආත්ම පරිත්‍යාගයේ ජීවිතයකට යොමු වීම.
- ♦ ලෞකික ආශාවන්ට, ආත්මාර්ථයට මැරී දෙවිඳුන් තුළ නිදහස් දරුවන් ලෙස ජීවත් වීමට යොමු වීම.
- ♦ දානධර්ම දීමද, මර්ධන ක්‍රියා කිරීම, අසරණයන්ට පිහිට වීම, ආදි භක්ති අභ්‍යාසවලට යොමු වීම.
- ♦ පාද නමස්කාරය, ශු. පැය වැනි භක්ති අභ්‍යාසවල නිරතවීම.

7. i යාච්ඤාවේ තිබිය යුතු අරමුණු **පහක්** ලියන්න.

- ♦ ස්වාමින් වහන්සේගේ මහිමය වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද, ප්‍රකාශ කිරීම.
- ♦ සහෝදරයන්ගේ ආත්මික හා ශාරීරික අවශ්‍යතා සඳහා දෙවිඳුන් යැදීම.
- ♦ දෙවිඳුන්ගේ මහිමය සඳහා ක්‍රිස්තුන් වහන්සේ තුළ ලෝකය ඒකරාශි කිරීම.
- ♦ දෙවියන් වහන්සේ වෙත අපගේ භක්ති ආදරය ප්‍රකාශ කිරීම.
- ♦ අපගේ ආත්මික හා ශාරීරික අවශ්‍යතා දෙවිඳුන් වෙත යොමු කිරීම.
- ♦ සමිඳු ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්වීම.

ii යාච්ඤාව තුළින් අපගේ අවශ්‍යතා ඉටු නොවන බව පවසන ඔබ මිතුරකුට ඔබ දෙන පිළිතුර පෙළි දහයකින් පැහැදිලි කරන්න.

- ♦ යාච්ඤාව යනු දෙවියන් වහන්සේ හා කරන සංවාදයක් බවත්, දේව අභිමතයට එකඟවීම යාච්ඤාවේ අරමුණ බවත් පෙන්වා දීම.
- ♦ දේව කැමැත්තට එකඟවූ අබ්‍රහම්ට ඔහුගේ අවශ්‍යතා ඉටු වූ බව පෙන්වා දීම.
- ♦ අධ්‍යාත්මික අවශ්‍යතා සපුරා ගැනීම තුළින් ශාරීරික අවශ්‍යතා ඉටුවන බව.
- ♦ බැහැපත්ව යාච්ඤා කළ යුතු බව.
- ♦ නොකඩවා යාච්ඤා කළ යුතු බව.
- ♦ ක්‍රිස්තුන් වහන්සේ ඉගැන් වූ යාච්ඤාව තුළ ගැබ් වී ඇති කරුණු අපගේ යාච්ඤාව තුළ ද ගැබ්විය යුතු බව.
- ♦ දෙවියන් වහන්සේ සියල්ල ඉටු කරන බව.
- ♦ අපගේ පාපිෂ්ඨ බව පිළිගෙන යාච්ඤා කළයුතු බව.
- ♦ අප ඉල්ලන දෙය තුළින් අයහපත් වන්නට දෙවියන් වහන්සේ ඉඩ නොතබන බව.
- ♦ ප්‍රේමයෙන් යුක්තව එකමුතුව යාච්ඤා කළයුතු බව.
- ♦ පූර්ණ අවධානයෙන් හා භක්තියෙන් යුතු ව යාච්ඤා කළයුතු බව..

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(එකකට පේළි **පහක්** පමණ)

**I. ශුද්ධ වූ දේශයේ ආගමික පසුබිම**

- ♦ ආරොන්ගේ පෙළපතින් පැවත එන පූජක පිරිසක් විසින් ජෙරුසලම් දේව මාළිගාවේ ආගමික තේවාවන් කිරීම.
- ♦ දිනපතා පූජා ඔප්පු කිරීම, පූජාසනයේ ගිනිදැල්වීම, පහන් රුක දැල්වීම, පිදුම් රොටී පිළියෙල කිරීම හා ව්‍යවස්ථාව දැක්වීම ඔවුන්ගේ කාර්යයන් බව.
- ♦ සෑම ධර්මශාලාවක ම ව්‍යවස්ථාව හා දිවැසාවලිය තැන්පත් කර තිබූ අතර යාච්ඤා කිරීම හා ශුද්ධ වූ ලියවිල්ල පහදා දීම එහිදීම සිදුවිය යුතු බව.
- ♦ දින්දීම හා උපවාසය විශේෂ ආගමික සම්ප්‍රදායක් වූ බව.
- ♦ සබත විශේෂ ආගමික පිළිවෙතක් වූ බව.
- ♦ ජෙරුසලෙම් විශේෂ මංගල්‍යය පැවැත්වෙන සෑමවිට ම ජනතාව දේව මාළිගාවට රැස් වූ බව.
- ♦ ගීතාවලිය විශේෂ යාච්ඤා පොත බව.

## II. සත්ප්‍රසාදික ස්තෝත්‍ර ගීය

- දේව ජනතාව සමග පිදෙන ක්‍රිස්තුන් වහන්සේගේ ම යාච්ඤාව යි.
- මෙය මුළුමනින් ම පූජා ප්‍රසාදීතුමා විසින් ප්‍රකාශ කරයි.
- එහෙත් තුන් ප්‍රකාර සාධුකාරය තුළින් ජනතාව ද ඊට සහභාගි කරවා ගනී. එනම්,
  - සුවිශුද්ධය ගායනා කිරීම.
  - විශ්වාසයේ අභිරහස ප්‍රකාශ කිරීම.
  - ගාම්භිර එහෙයියාව තුන් ප්‍රකාර සාධුකාරයයි.
  - තුන් ප්‍රකාර සාධුකාරය ශබ්දනගා ප්‍රකාශ කිරීම,ක්‍රියාකාරි සහභාගිත්වයක ලක්ෂණය වෙයි.

## III.ජනවන්දනා වසර

- කිතු සමිඳුන්ගේ  පාස්කු අභිරහස හා ගැලවීමේ කාර්යය සදාතනික ව සිහිපත් කිරීමට,
- ජනතාව ඒ තුළ ජීවත් කරවීමට නිලවශයෙන් වසරේ කාලසීමාවන් සකස් කර ඇති බව.
- දෙවියන් වහන්සේට නමස්කාර කිරීම, උන්වහන්සේගේ ගුණ පැසසීමට, අපව ශුද්ධවන්ත කර දේව ප්‍රසාද නිධාන දානය කිරීමට මේ ජනවන්දනා වසර තුළ සභාව කටයුතු කරන බව.
- ජනවන්දනා පිළිවෙතට අනුව මෙම කාලය වසර 3කට බෙදා
  - පළමු වසර මතෙව් සුවිශේෂය ද,
  - දෙවන වසර මාක් සුවිශේෂය ද,
  - තෙවන වසර ලූක් සුවිශේෂය ද,
  - ජොහන් සුබාරංචිය, මාක් සුබාරංචියේ අඩු කොටස සම්පූර්ණ කිරීමට පාස්කු කාලයේ දී භාවිතා කරන බව.

## IV. යාච්ඤා කිරීම පිළිබඳව සඳහා ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශ

- නිරාහාරව යාච්ඤා කිරීම (මතෙව් 4:2)
- හිරු උදාවට පෙර යාච්ඤා කිරීම (මාක් 1:35)
- පියාණන් වහන්සේගේ කැමැත්තට එකඟ ව යාච්ඤා කිරීම. (මාක් 6:39)
- නොකඩවා යාච්ඤා කිරීම (මතෙව් 4:2)
- ශුද්ධාත්ම වරම් ඉල්ලා යාච්ඤා කිරීම

## V. මෝක්ෂ අභිරහස්

- ක්‍රිස්තුන් වහන්සේ ගේ හා දේව මාතාවන්ගේ ජීවිතයේ ප්‍රධාන සිදුවීම් ගැලවීමේ අභිරහසට සම්බන්ධ වන අයුරින් ජපමාලය උච්චාරණය කිරීම අර්ථවත් කරන ගැඹුරු යාච්ඤාවකි.  මෙනෙහි කිරීමකි. ජපමාල පන්ති සමග උච්චාරණය කරන අභිරහස් වර්ග 4ක් ලෙස දැක්වෙන අතර, බදාදා සහ ඉරිදා දිනවල සිදු කරයි.
  - ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වීම
  - ස්වර්ගාරෝහණය
  - ශුද්ධාත්මාගමනය
  - දෙව් මව්ගේ ස්වර්ගාරෝපණය
  - ස්වර්ග රාජ්‍යයේ රාජේශ්වරිය ලෙස ඔටුණු පැළඳවීම
    ද මෝක්ෂ අභිරහස් මගින් මෙනෙහි කරනු ලබයි.

## දහම් ගුරු ප්‍රථම විභාගය - 2020

## II පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

---

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

I. i. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ආරම්භ කිරීමට පසුබිම් වූ කරුණු **දෙකක්** ලියන්න.

- ♦ විශ්වාසයට හා ශීලධර්මයට විරුද්ධව පැණනැගී ඇති දුර්මත බිඳ දැමීම.
- ♦ පරිවර්තන යුගයකට ගැලපෙන ලෙස විනය කරුණු සකස් කිරීම.
- ♦ සභාවේ තත්ත්වය සවිස්තර ව විග්‍රහ කිරීම.
- ♦ රාජ්‍ය සමග අත්වැල් බැඳ ගැනීම.

ii. xxiii වන ජුවාම් සුදොතුම් පියතුමාගේ නායකත්වය යටතේ ශුද්ධ වූ සභාව සුබවාදී ව ගමන් ඇරඹූ බවත්, සුබසාධක වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කළ බවත් ප්‍රකාශවන එතුමාගේ විශ්ව ලේඛන **දෙකක්** නම් කරන්න.

- ♦ අයුක්තියට පිළිතුර ♦ ලෝක සාමය

iii. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සාකච්ඡාවල ප්‍රධාන තේමා **දෙකක්** නම් කරන්න.

| | | |
|---|---|---|
| ♦ දෙවියන් වහන්සේ | - | ආදරවන්තයෙක් බව. |
| ♦ මනුෂ්‍යයා | - | දේව ස්වරූපයට හා දේව සමානකමට මවා ඇති බව. |
| ♦ ශුද්ධවූ සභාව | - | උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ඉතිහාසය තුළ ලෝකාන්තිමය දක්වා වැඩ සිටීම. |
| ♦ ලෝකය | - | මුළු මිනිස් සංහතියම එක ම පවුලක් ලෙස ජීවත්වීම. |

iv. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් පසු තම ශ්‍රාවකයන්ට දුන් අවසාන ආඥාව කුමක් ද?

- ♦ සකල ජාතීන් ගෝලයන් කිරීම.

v. දහම් ගුරුවරයාගේ ජීවිතාදර්ශය කෙලෙස විය යුතු ද? කරුණු **දෙකක්** ලියන්න.

- ♦ දහම්ගුරුවරයාගේ ජීවිතය හා සේවය ක්‍රිස්තුන් වහන්සේ හා පියාණන් සමග විය යුතුය.
- ♦ යාච්ඤා ජීවිතයත්, ආත්ම ත්‍යාජයත් දහම් ගුරුවරයා තුළින් දිස්විය යුතු ය.
- ♦ ආධ්‍යාත්මික ගුණාංග මගින් තමා උගන්වන දෙයට සාක්ෂි දැරිය යුතු ය.
- ♦ විශ්වාසයේ ආලෝකයෙන් පණගැන් වී ක්‍රියා කළ යුතු ය.
- ♦ ලෞකික අරමුණුවලින් ඈත්විය යුතු ය.
- ♦ තම ජීවිතය තුළින් සුවිශේෂක වටිනාකම් පිළිබිඹු විය යුතු ය.
- ♦ සමාජයට ආදර්ශයක් විය යුතු ය.

vi. ධර්මෝපදේශය ඉගැන්වීම පිළිබඳව දෙවන ජුවාම් පාවුලු සුදොතුමා පියා දුන් උපදෙස් **දෙකක්** දෙන්න.

- ♦ ධර්මෝපදේශය ක්‍රමික අරමුණු සහිත විය යුතු ය.
- ♦ ධර්මසාරය හැර අනවශ්‍ය ප්‍රශ්න එහි අඩංගු වීම යෝග්‍ය නොවේ.
- ♦ ධර්මෝපදේශය එල්ලවන්නේ දේව ධර්ම ශාස්ත්‍රීය නිරීක්ෂණය වෙත නොව ඇදහිල්ලේ ජීවිතය වෙත ය.
- ♦ සෑම ආගම පාඩමකට ම පූර්ණභාවයක් තිබිය යුතු ය.

vii. ධර්මය ඉගැන්වීම තුළින් අපේක්ෂා කරන්නේ කුමක් ද?

- ♦ ශුද්ධ වූ බයිබලය තුළ ඇති පණිවුඩයත්, එයට දැක්විය යුතු ප්‍රතිචාරයත් හා ඒ අනුව ජීවත් වීමත් ධර්මය තුළින් අපේක්ෂා කෙරේ.

viii. සෑම කිතුනු නායකත්වය ම අරමුණ විය යුත්තේ කුමක් ද?

- ♦ ලෝකය ශුද්ධවත් කර ඒ තුළ දේව රාජ්‍යය ගොඩ නැංවීම.

ix. ගැලවීමේ ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ තෝරාගත් නායකයින් **දෙදෙනෙක්** නම් කරන්න.

♦ ආබ්‍රහම් ♦ ඊසාක් ♦ ජාකොබ් ♦ ජෝශප්

x. හොඳ නායකත්වයකට අවශ්‍යවන ගුණාංග **දෙකක්** නම් කරන්න.

♦ පෞරුෂය ♦ ජනප්‍රියත්වය ♦ ස්වීයත්වය (නිර්මාණ ශක්තිය)

xi. ගුරුවරයෙකු ලෙස කැඳවීම ලැබුවකුගේ වගකීම් **දෙකක්** ලියා දක්වන්න.

- ♦ ක්‍රිස්තුන් වහන්සේගේ ස්වරූපය අන්අය තුළ නිර්මාණය කිරීම.
- ♦ තමා අන් අයට ක්‍රිස්තුවරයෙක් වීම.
- ♦ තමා ක්‍රිස්තුන් වහන්සේ ව අත්දකිමින් අන් අය එම අත්දැකීමට ඇතුළු කරවීම.
- ♦ දරුවන් තේරුම් ගැනීම.
- ♦ දරුවන්ගේ විශ්වාසය ගැඹුරු කිරීම හා වර්ධනය කිරීම.
- ♦ වගකීම් සඳහා දරුවන් යොමු කිරීම.

xii. පැරණි ගිවිසුම තුළ දේව ජනතාවට ලැබුණ මාර්ගෝපදේශයන් **දෙකක්** ලියන්න.

- ♦ දසපනතෙන් දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

xiii. ප්‍රාථමික පන්තිවලට කතෝලික ධර්මය ඉගැන්වීමේ දි සැලකිය යුතු කරුණු **දෙකක්** ලියන්න.

- ♦ සරල ක්‍රම භාවිතය
- ♦ පාඩම් නිවැරදි ව ඉගැන්වීම.
- ♦ ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර වැඩි වශයෙන් භාවිතය.
- ♦ ශිෂ්‍ය රුචි අරුචිකම් අනුව පාඩම සකස් කර ගැනීම.
- ♦ ක්‍රීඩා, නාට්‍ය,රංගන, කථාන්තර, පින්තූර ආදිය පාඩම ඉගැන්වීම සඳහා උපයෝගි කර ගැනීම.
- ♦ සිසුන් ජීවත්වන පරිසරය සමග සිසුන් හඳුනා ගැනීම.

xiv. 1 සිට 3 දක්වා ශ්‍රේණිවල කතෝලික ධර්මය විෂයට අදාළ නිපුණතා **දෙකක්** ලියන්න.

- ♦ දෙවියන්සේ ගේ ආදරය,මැවිල්ල ඇසුරෙන් අත් දකියි. තුති පුදයි. ප්‍රති ප්‍රේමය දක්වයි.
- ♦ දෙව්පියාණන් වහන්සේ සමග කථා කරයි.
- ♦ දෙව්පියාණන් වහන්සේගේ ම දරුවකු බවට පත් වෙයි.
- ♦ ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි.
- ♦ සාන්තුවර චරිත හා ශු. බයිබලය හඳුනා ගනියි.

xv. ප්‍රාථමික පන්තිවලට අදාළ විෂය අරමුණු **දෙකක්** ලියන්න.

- ♦ සමාජයේ ගෞරවාදරයට බඳුන් වන සැදැහැවත් කිතුනු දරුවකු බිහි කිරීම.
- ♦ කිතුනු ප්‍රතිපත්ති අනුගමනය කරන ජීවන දර්ශනයක් ගොඩ නංවා දීම.
- ♦ ශුද්ධ බයිබලය යනු දේව වචනය බවට දැනුවත් කරමින් ශුද්ධ වූ බයිබලයට අනුකූල ව ජීවත්වීමට දිරි ගැන්වීම.
- ♦ දෙවි පියාණන් වහන්සේ සමග ආත්මීය සබඳතා ගොඩ නගා ගැනීමට පුරුදු පුහුණු කිරීම.
- ♦ මරිය තුමියගේ හා සාන්තුවරයන්ගේ චරිතවලින් ආදර්ශ ලබා දීම.
- ♦ දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේද, සකසුරුවම් ලෙස ද පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම.
- ♦ ස්වභාව ධර්මයෙන් හා තමා අවට ජීවත් වන අය මගින් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම.
- ♦ සියල්ලන්ට ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතුව, සමගියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම.
- ♦ අන්‍යාගම්වලට ද ගරු කරමින් සහයෝගිතාවෙන් යුතුව ජීවත් වීමේ වැදගත් ගුණාංග වර්ධනය කිරීම.
- ♦ ශ්‍රී ලංකාවේ කතෝලික සභාවේ වගකීම් හා කාර්යභාර්ය පිළිබඳ අවබෝධයක් ලබා දීම

xvi. දෙවන ශ්‍රේණිය පෙළපොතේ සඳහන් සාන්තුවර චරිත **දෙකක්** ලියන්න.

♦ සාන්ත දොමිනික් සාවියෝ තුමා ♦ සාන්ත නිකුලස් තුමා

xvii. හතරවන ශ්‍රේණිය පෙළපොතේ අවධානය යොමු කරන ප්‍රධාද නිධාන **දෙකක්** ලියන්න.

♦ ප්‍රසාද ස්නාපනය, ♦ පාපොච්චාරණය, ♦ අභිවෘද්ධි ආලේපය

xviii. අපෝසතුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරිමෙන් පසු සභාව වැඩි දියුණු වූ ආකාරය පිළිබඳ කියැවෙන ලිඛිත සාක්ෂි **දෙකක්** ලියන්න.

- ♦ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
- ♦ හසුන්පත්, රදගුරු ක්ලේමන්ට් තුමාගේ හා අන්තියෝකයේ ඉග්නාසියුස් තුමාගේ සමහර ලිපි.
- ♦ අපොස්තුළුවරුන්ගේ ඉගැන්වීම් ඇතුලත් ''ඩිඩාකේ ග්‍රන්ථය''

xix. සභා ව්‍යාප්තිය සමග බිහි වූ කිතුනු ජනපදවලට පාලනය සඳහා පත් කළ වැඩිහිටියන් හා ප්‍රධානින් හැඳින්වූයේ කිනම් නම්වලින් ද?

- ♦ වැඩිහිටියන් - ප්‍රෙස්බිටරෝයි
- ♦ ප්‍රධානීන් - එපිස්කෝපෙයි

xx. කතෝලික සභාවට එරෙහිව ඇති වූ පළමු පීඩනයේ දී මරණයට පත් කළ ආගමික නායකයන් දෙදෙනා කවුද?

♦ ශු. පේදුරු තුමා හා ශු. පාවුලු තුමා

2. i වැලේරියානු අගරජ සමයේ (257 - 260) කිතුනු සභාවට එරෙහි ව එල්ල කළ පීඩනයන් **පහක්** ලියා දක්වන්න.

- ♦ ක්‍රිස්තියානි පොත් පුළුස්සා දැමීම.
- ♦ දෙව් මැදුරු විනාශ කිරීම.
- ♦ සභාව සතු දේ රාජසන්තක කිරීම.
- ♦ රාජගුරුප්‍රසාදිවරුන්, පූජකවරුන්, තේවාචාර්යවරු සිරගත කිරීම.
- ♦ එතුමන්ලා මරණ වේදනා තුළ රෝම දෙවි දේවතාවුනට පූජා කළයුතු බවට නියෝග කිරීම.

ii දහම්ගුරුවරයාගේ පරමාදර්ශය ක්‍රිස්තුන් වහන්සේ බව සනාථ කරමින් පුවත් පතකට අවශ්‍ය කරුණු **පහක්** පැහැදිලි කරන්න

- ♦ ක්‍රිස්තු ධර්මයේ නිර්මාතෘවරයා ක්‍රිස්තුන් වහන්සේ ය.
- ♦ සියලුම ධර්මෝපදේශකයින්ගේ පරමාදර්ශය වන්නේ ද උන්වහන්සේ ය.
- ♦ උන්වහන්සේ ඉගැන්වූ දේ ක්‍රියාවෙන් පෙන්වූ සේක.
- ♦ උන්වහන්සේට එල්ලවන අභියෝගවලට එඩිතරව මුහුණ දුන් සේක.
- ♦ දුක්පීඩා ඉදිරියේ පවා දේව කැමැත්තට හිස නැමූ සේක.
- ♦ උන්වහන්සේ දිව්‍ය ගුරුවරයාණන් වූ සේක.
- ♦ තමන් කළ කාර්ය පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කළ සේක.
- ♦ උන්වහන්සේ ඉගැන්වීමේ ක්‍රම නිවැරදි ව උපයෝගි කරගත්සේක.

3. i හතරවන ශ්‍රේණියේ පෙළපොතට අනුව දේව ආදරයට සාක්ෂි දැරුවන් **පස් දෙනෙක්** නම් කරන්න.

- ♦ ශු. කුඩා තෙරේසා මුනිවරිය
- ♦ අති උතුම් තෝමස් කුරේ කාදිනල් හම්පාණන්
- ♦ සාමුවෙල් දිවැස් ප්‍රසාදි තුමා
- ♦ දාවිත් රජතුමා
- ♦ ශු. දොමිනික් සාවියෝ මුනිතුමා
- ♦ මෝසෙස් තුමා
- ♦ එලිසා දිවැස්ප්‍රසාදි තුමා
- ♦ පේදුරු තුමා

ii හතරවන ශ්‍රේණියේ ළමුන්ට දිව්‍ය පූජාවේ අගය පිළිබඳ ඔබ දෙන මග පෙන්වීම් **දහයක්** ලියන්න.

- ♦ ජනවන්දනාවේ උතුම ම මෙහෙයයි.
- ♦ පාස්කු අභිරහස සිහි කිරීම හා සිදු කිරීම.
- ♦ දෙවියන් වහන්සේගේ උත්තරීතර ප්‍රේමය දිව්‍ය පූජාවයි.
- ♦ දිව්‍ය පූජාවේ බලය, අනුහස, ශක්තිය තුළින් කිතුනුවාට නව ජීවිතයක් ලැබේ.
- ♦ මිනිසා හා මිනිසා සමගත් මිනිසා හා දෙවියන් වහන්සේ සමගත් ප්‍රේමයෙන් එකට එක්වන්නේ දිව්‍ය පූජා යාගය තුළිනි.
- ♦ විශ්ව සබඳතාවය තහවුරු කරන ප්‍රේමයේ උත්තරිතර සංකේතයකි.
- ♦ සහෝදරත්වයේ හා එකමුතුකමේ හමුවකි.
- ♦ ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ අභිරහස ලෝකය තුළ ජීවමාන කෙරේ.
- ♦ දිව්‍ය පූජාව තුළ දිව්‍ය සත්ප්‍රසාදය අර්ථාන්විත වේ.
- ♦ අපගේ ජීවිත යාගයක් කොට පියාණන් වහන්සේ පුදනු ලබයි.

4 i මෝසෙස් තුමාගේ නායකත්වයෙන් ඔබට ගත හැකි ආදර්ශ **පහක්** කියන්න.

- ♦ දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසය
- ♦ වගකීම් භාර ගැනීම.
- ♦ නියමිත ඉලක්කයක් කරා ගමන් කිරීම.

♦ තමන් ලැබූ නායකත්වයේ කැඳවීම පිළිගැනීම.
♦ ගැටළු විසඳීමේ දි ප්‍රඥා ගෝචරවීම.
♦ බාධාවන් මැද ගමන් කිරීම.
♦ සැමවිටම දේව කැමැත්ත විමසීම.
♦ කීකරුකම

ii දහම් ගුරුවරයාට තම මීසම තුළ කළ හැකි ධර්මදූතික ක්‍රියාකාරකම් **පහක්** පැහැදිලි කරන්න.
♦ පූජාප්‍රසාදිතුමාගේ ධර්මදූතික ක්‍රියාවලට සහය වීම.
♦ දරුවන් දිව්‍ය පූජාවට සහභාගි කරවීම.
♦ කිතුනු ඒකකවල ක්‍රියාකාරිත්වයට දායක වීම.
♦ විවිධ ළමා සමිතිවලට දරුවන් සහභාගි කරවීම.
♦ ආගමික වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.
♦ දරුවන්ගේ දෙමව්පියන්ට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
♦ පොදු ජනවන්දනාව තුළ ක්‍රියාකාරිවීම.

5. i සභා පියවරු යනු කවුද? කරුණු **පහකින්** දක්වන්න
♦ අපෝස්තුළුවරුන්ගෙන් පසු නිර්මල කිතුදහම රැකගත් පිරිස.
♦ දේව ජනතාවගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරී වූ කණ්ඩායමක්.
♦ ඉගැන්වීමෙන් හා දේශනයෙන් ජනතාවට මග පෙන්වූ පිරිසක්
♦ ග්‍රීක හා ලතින් බසින් ලේඛන රැසක් කළ මොව්හු සභා උන්නතියට දායක වූ උගතුන් පිරිසකී.
♦ ශුද්ධවන්ත ආදර්ශමත් ජීවිත ගත කළ ඔවුන්ගේ සේවය උත්තරීතර විය.
♦ මොවුන් අතරින් ශු. ජස්ටින් තුමා, අතනාසියුස් තුමා ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා, ජෙරොම්තුමා, අගොස්තීනු තුමා යන අය ඉතා ප්‍රකට ය.

ii 'සභා පියවරුන්ගේ ජීවිතයෙන් දහම්ගුරු ඔබට ගතහැකි ආදර්ශ **දහයක්** දෙන්න.
♦ ආදර්ශමත් ශුද්ධවන්ත ජීවිත ය.
♦ ක්‍රිස්තුධර්මය වෙනුවෙන් ඉදිරිපත් වීම.
♦ තම හැකියාවන් උපරිම සේවය සඳහා යෙදවීම.
♦ පූර්ණ කැපවීම.
♦ දැනුම බෙදා හදා ගැනීම.
♦ සභා ව්‍යාප්තියට කැපවීම.
♦ සමාජ ප්‍රශ්නවලට අවධානය යොමුවීම.
♦ ආගමික පොත පත ලිවීම.
♦ ධර්ම ගැටළු විසඳීම.
♦ වගකීම භාර ගැනීම.
♦ යුක්තිය සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කිරීම.

6. i ධර්මෝපදේශයේ අරමුණ කරුණු **පහකින්** දක්වන්න.
♦ පූර්ණ මානව ස්වියත්වයක් ගොඩ නැගීම හා දෙවියන් වහන්සේ වෙත මිනිසාගේ සිත හැරවීම.
♦ දේව වචනය දීමෙන් සැබෑ මනස්ථාපනයක් ජනිත කරවීම.
♦ පූර්ණ ක්‍රිස්තු අභිරහස වෙත ඔහුව ගෙනයාම.
♦ පාස්කු අභිරහසට ප්‍රායෝගික ව සාක්ෂි දැරීමේ හැකියාව ගොඩ නැංවීම.
♦ දේව ජනතාවගේ විමුක්තිය සඳහා ක්‍රියා කළහැකි පුද්ගලයන් බිහි කිරීම.
♦ ලෞකික පටිපාටිය තුළට සුවිශේෂ අගයයන් ඇතුළත් කර එය ශුද්ධවත් කිරීම.

ii ධර්මෝපදේශ කේෂ්ත්‍රය තුළ ශිෂ්‍යයා වැදගත් වන්නේ මන්දැයි කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

- ♦ අද ආගම ඉගැන්වීම තුළ ශිෂ්‍යයා වැදගත් ම සාධකය වී ඇත.
- ♦ අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය වීම ඊට හේතුවයි.
- ♦ දහම උගන්වන ගුරුවරයාට විෂය පමණක් නොව අධ්‍යාපන මනෝවිද්‍යයාව හා අධ්‍යාපන මූලධර්ම පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය.
- ♦ ''ජොන්ට අකුරු ඉගැන්වීමට පෙර ජොන් ගැන දැනගත යුතු ය'' යන්නෙන් ශිෂ්‍යාව තේරුම් ගැනීමේ අවශ්‍යතාවය වඩාත් ගම්‍ය වේ.''
- ♦ සිසුන් පිළිබඳ හොඳ අවබෝධයක් තුළින් ඉගැන්වීමේ කාර්යය සාර්ථක වේ.
- ♦ එසේ කිරීමට ගුරුවරයා සිසුන් අතර මාංශගතවිය යුතු ය.

7. i මුල් සියවස තුළ කතෝලික සභාව මුහුණ දුන් අභියෝග **පහක්** ලියා දක්වන්න.

- ♦ රෝම අධිරාජ්‍යවාදීන්ගේ අභියෝග
- ♦ ජුදා ආගමික නායකයින්ගේ විරෝධය
- ♦ ප්‍රාදේශීය නායකයන්ගේ විරෝධය
- ♦ හිතුවක්කාර කිතුනුවන්ගේ අභියෝග
- ♦ සමකාලීන දූෂිත ඇදහිලි
- ♦ විවිධ වේදභේද කාරයින්ගේ අභියෝග

ii මුල් සභාව මුහුණ දුන් පීඩන මධ්‍යයේ ඔවුන් රැකගත් විශ්වාසයේ ජීවිතය තුළින් අද කිතුනුවන්ට ගත හැකි ආදර්ශ **පහක්** පැහැදිලි කරන්න.

- ♦ ගැඹුරු දේව විශ්වාසය
- ♦ ධර්මය කෙරෙහි ඇති ආදරය
- ♦ ආදර්ශමත් ජීවිත රටාව
- ♦ එඩිතරභාවය
- ♦ දහමට ඇති ආදරය
- ♦ කිතුනු සාක්ෂිය
- ♦ ධර්ම ප්‍රචාරක කටයුතු
- ♦ දුක්වේදනා සතුටින් දරා ගැනීම.
- ♦ ප්‍රාණ පරිත්‍යාගි ජීවිත රටාව

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

### I. බැසිල් තුමා

- ♦ ක්‍රි.ව 330 - 376 කාලය ජීවත් වූ ඔරිගන් තුමාගේ ගෝලයෙකි. සුප්‍රසිද්ධ ලේඛකයෙකි. තාපස ජීවිතය පිළිබඳ ලියූ ප්‍රධාන ලේඛකයෙකි. ගිහි ජීවිතය ගැන ටෝරාලියා නමින් ලියූ මෙතුමාගේ ග්‍රන්ථය ද සුප්‍රසිද්ධ ය.
- ♦ තපස් ජීවිතය ගැන ව්‍යවස්ථාවක් සකස් කළේ මෙතුමා ය.

### II. කතෝලික සභාව මුහුණ දුන් පළමු පීඩනය

- ♦ ක්‍රි. ව. 64-68 නීරෝ අගරජ යටතේ ඇති විය.
- ♦ ඔහු රෝමයට ගිනි තබා එම වරද කිතුනුවන් පිට පවරා ඔවුනට චෝදනා කර ජනතාව ක්‍රිස්තු විරෝධීන් බවට පත්වීම නිසා පීඩනය ඇතිවිය.
- ♦ ක්‍රිස්තු භක්තිකයන් විශාල පිරිසක් ක්‍රීඩා භූමියක් තුළ සතුන්ට ගොදුරු කළ හ.
- ♦ තවත් පිරිසක් ටයිබර් නදියේ ගිල්වා මැරූහ.
- ♦ තවත් පිරිසකට තාර ආලේප කර ගිනි තබා පහන් කණු මෙන් නෘත්‍ය ශාලා ආලෝකවත් කිරීමට යොදා ගත්හ.
- ♦ පේදුරු තුමා කුරුසියේ ඇණ ගැසූ අතර, පාවුලු තුමා හිස ගසා මරා දමන ලදී.
- ♦ මෙම පීඩනය රෝමයට පමණක් සීමා විය.
- ♦ ක්‍රි.ව. 68 දී නීරෝ සියදිවි නසාගැනීමත් සමගම මෙම පීඩනය අවසන් විය.

## III. 2 ශ්‍රේණියේ කතෝලික ධර්මය පෙළපොත

- තේමා පහකි.
- නව වසරට තුති පිදීම.
- නැමදීමේ ඉරියව්
- එදිනෙදා ජීවිතේ දී අපට සහය වන්නෝ
- සරල ජීවිත පැවැත්ම.
- ශු. බයිබලයේ චරිත

(මේවා එකිනෙකට එක වාක්‍ය බැගින් පැහැදිලි කරන්න.)

## IV. දහම් පාඩම සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර භාවිතය

- ඇසට පෙනෙන, කණට ඇසෙන දෑ ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර වේ.
- ශ්‍රව්‍ය දෘෂ්‍යාධාර යොමු කිරීමේ දී සිසුන්ගේ වයස, පන්තිය හා අවබෝධ මට්ටම ගැන සැලකිලිමත් විය යුතු ය.
- පෝස්ටර් වර්ණවත් වීම. සැමට පෙනෙන සේ අකුරු යෙදීම.
- ශ්‍රව්‍ය මාධ්‍ය සැමට පැහැදිලිව ඇසෙන සේ යොදා ගැනීම.
- ඒ තුළින් වඩාත් උගන්වන දේ පැහැදිලි විය යුතු ය.

## V. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව නිකුත් කළ ව්‍යවස්ථා

දෙවන වතිකානයෙන් ගත් තීරණ ප්‍රකාශන 16කින් නිකුත් කරන ලදී. එයින් ව්‍යවස්ථා හතරක් ඇත.

- ජනවන්දනා පිළිබඳ ව්‍යවස්ථාව
- ශුද්ධවූ සභාව පිළිබඳ ව්‍යවස්ථාව
- දේව ප්‍රකාශනය පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
- නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව පිළිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව (වර්තමාන ලෝකයේ ශු. සභාව ව්‍යවස්ථාව)